ශාස්ත්‍රීයයි සංකීර්ණයි

ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි

"දෙරියන් නවගුලක් රඹකඳ මැන ගන්න"

කෙසෙල්

"රඹ වතු කඳල දිගු දල වල් නිහර දල
සිරිදල සමත් නම්වේ දනු මැන කෙසෙල
මහරඹ අමා රළු වතු වල් මා කඳල
අළුමල් බඳුරු පල නම්වේ අළු කෙසෙල"

මෙසේ කඳලි, දිගුදල, මෝවපල, රඹ, වතුකැන් ආදී නම් වලින් හැඳින්වෙන කෙසෙල් සි... මංගල උත්සව, දන්දීම, බලිතොවිල් හැම අවස්ථාවකදීම නැතිවම බැරි පලවැලකි. ලංකාවේ හැම

ගෙවත්තකම වැවෙන කෙසෙල් ගැමි ආර්ථිකයේ විශේෂ තැනක් ගනී. ඇඹුල්, සුවඳෙල්, කෝලිකුට්ටු, පුවාලු, රත්කෙහෙල්, අළුකෙහෙල්, ඇම්බුන්, නේත්‍රපලම්, බිම්කෙසෙල්, ඇටිකෙහෙල් ආදී විවිධ නම් වලින් හැඳින්වෙන කෙසෙල් වර්ග 35 ක් පමණ ඇතැයි ශාක විද්‍යාඥයන් ප්‍රකාශ ඇතැම් කෙසෙල් වර්ග පලතුරක් හැටියටත් ඇතැම් වර්ග එළවළුවක් හැටියටත් විශේෂත්වයක් ...

කෙහෙල්ගමුව, කෙහෙල්වල, මා කෙහෙල්වල, කෙහෙල් හේනාව, කෙසෙල් වත්ත, රඹා ව ආදී ග්‍රාම නාමයන් කෙසෙල් හා නෑකම් කියයි.

"පක්වං රුචිකරං ශිතං - සාධු වෘෂ්‍යංව වාංහනම්
ක්ෂුත් තෘෂ්ණා මෙහ රොගඝ්නං - චක්ෂු ෂ්‍යං රුචං මාංශ කෘත්"

"සාරාර්ථ සංග්‍රහය"

මේ අනුව ඉදුණු කෙසෙල් ධාතු වඩවයි. සා පවස නිවයි. ප්‍රමේහය නසයි. ඇසට හිතකර

ස්ථූලඃ කෘශත්වමායාති - ස්ථූලත්වංච කෘශස් තථා
මොචා පලානං පක්වානං - කාදනාද නිවාර්යතඃ

ඉදුණු කෙසෙල් ගෙඩි කෑමෙන් තරබාරු අය කෙට්ටු වන බවද කෙට්ටු පුද්ගලයා තරබාරු වන බවද ආයුර්වේද මතයයි. රත් පිත් රෝගියාට කෙසෙල් හිතකරය. එහෙත් සෙම වඩවයි. අලු කෙසෙල් අලයේ ඉස්ම හැම විෂටම ඔසුවකි. කල්ක, ගුලි, තෛල ආදිය නිෂ්පාදනයේදී සංයෝග කරගනු ලැබේ. කෙසෙල් බඩ වෑංජනය විෂම ජ්වරය (මැලේරියාව) නසයි. ඇතැම් බෙහෙත් වර්ග උණු අළු පල්ලේ තම්බන්නේ කෙසෙල් කොලයක ඔතා අළු යට දැම්මෙනි. වන කඳලි, අරණ්‍ය කඳලි වැනි නම් වලින් හැඳින්වෙන ඇටි කෙසෙල් අෂ්ටවිධ පානයට අයත්ය. "ඇටි කෙහෙල් කෑ උගුඩුවා වගේ" යන උපමාව ගෙනී ඇත්තේ ඇටි කෙසෙල් ඇට උදරය මොලොක් කරන විරේක ගුණයක් ඇති බැවිනි.

කෙසෙල් කොලය බත් ඔතන්නට ඉතා සුදුසුය. කුඹුරේදීත් වෙනත් වැදගත් අවස්ථාවලදීත් කෙසෙල් කොල වලට බෙදා ගත් ආහාරය වැළඳීම වඩාත් රුචිකරය. සාංඝික දාන වලදී කැවිලි වසා තබන්නට කවාකාරව කපාගත් කෙසෙල් කොල භාවිතා වේ. දමිළ ආපන ශාලාවල බත්, ඉඳි ආප්ප ආදිය කෑමට කෙසෙල් කොල සපයනු ලැබේ. බලි, තොවිල් වලදී මල් පැලට, තටුවට එලන්නේ කෙසෙල් කොලයි. සැරසිලි සඳහා කෙසෙල් පඳුරු යොදා ගැනේ. මල් ගෙනීමෙන් මුසු වූ කෙසෙල් පට්ටය තිරිඳුන් මුදුනට පවා සැපත් වූ අයුරු අලගියවන්නයෝ මෙසේ දකිති.

"කුලයෙන් නුනු දනෝ මහතුන්
සෙවුම් කොට
ඉසුරෙන් යුතුව පැමිණොත් ගරු
තනතුරට
වෙසෙසින් කුසුම් ගෙතුමෙන් සුමුසු
රඹ පට
සතොසින් සැපත් වේ තිරිඳුන්
මුදුනතට"

"සුභාෂිතය"

දිය කොරහ මල් බලිය, අසු ගැබේ මල් බලිය, මල් යහන්, පිදේන තටු ආදිය සරසා ගැනීමට රඹ කඳන් භාවිතා වෙයි. බලි සැරසිලි වලදී රඹ කඳ නියම පරිදි මැන ගන්නා අයුරුද ප්‍රකාශිතයි.

"දෙරියන් නවගුලක් රඹ කඳ මැන ගන්න
දසය දසය දෑතට හුයලා ගන්න"

"බලි ශාන්ති කවි"

ගෙදරක අසනීපයක් වූ විට සුවය පතා පත්තිනි මෑණියන් වෙනුවෙන් කිරි දානයක් දීමට භාර භාර වී කෙසෙල් ගසක් වෙන්කොට තබනු ලැබේ. කෙසෙල් කැන පැසුණු විට කපා ඉඳවා කැවුම් කිරිබත්ද ඉදිකොට කිරි අම්මාවරුන්ට දන් දී ආතුරයාට සෙත් පැතීම සිංහල සමාජයේ පවත්නා චාරිත්‍රයකි.

"හැම ගසකටම කොටන කොටිටෝරුවා කෙසෙල් ගසට කෙටු දා මට්ටු වේ" යන කියමන ගෙනී ඇත්තේ උගේ වකුටු නොට කෙසෙල් පතුරු වල කෙඳි වල පැටලී විනාශ විය හැකි බැවිනි. හැම දෙනාටම කරදර කරමින් යහතින් කල් ගෙවන අසත්පුරුෂයා කුඩා අයකු වෙතින් පාඩම් ඉගෙන ගන්නා බව ට ගැමියන් උපමා කළේ එලෙසිනි.

"සව් සරා සසිරි මුදුනේ වැඩෙන්නේ
නැව් පුරා රුවල් සුළඟට වැනෙන්නෙ
ගව් ගණන් ගොසින් මහතුන් දකින්නේ
මව් මරා උපන් කුමරා කියන්නේ"

ජන කවියා ඉදිරිපත් කරන මේ තේරවිලි සිව්-පදයට පිළිතුර මෙසේ ප්‍රකාශිතයි.

"සව්සරා සසිරි මුදුනේ වැඩෙන කල
නැව් පුරා රුවල් සුළඟට වැනෙන කල
ගව් ගණන් ගොසින් මහතුන් දකින කල
මව් මරා උපන් කුමරා කෙසෙල් මල"

ජන කවියාට පමණක් නොව වියත් කවියනට පවා කෙසෙල් අමතක වී නැත.

"අඹ දලු පල රඹා සිඳ නොතබායා
ගෙනෑ තම පිය අඹා තුඩග තබායා
සිඹ සිඹ රති ලොබා දෙපිය ගබායා
උන් පරපුටු සුබා සකි නරඹායා"

ගිරා සන්දේශයේ පෙමින් වෙලුණු කෝකිලයන් සුවලක් රඹ පල කරමින් සොම්නස් වූ අන්දම වර්.. අයුරුයි ඒ. කහ කුරුළු සන්දේශයේ ද මෙසේ කෙසෙල් ගැන කියයි.

"ජීවි තැවුලේ ගිම් දුරුවන පිරි රඹ ය
තුරු පුවලේ වල වලුබර මිහිරඹය
වියුරු පලේ කැන්ගෙන සිටිනා රඹය
වෙති සියලේ එවෙහෙර දිලෙනා "රඹය"

හංස සන්දේශයේ වන වැනුමේදී ඇට කෙසෙල් ගැන කවියා මෙසේ පවසයි.

"පෙර ගිරි පියා ඉඳු සුන් විසින්
ගිරි බෙයදෑ හී තැන තැන ගොසින්
ලෙලදෙන නොමින් පියපත් ලෙසින්
බල වන කෙසෙල් වන වන හිසින්"

ලාංකීය ජන ජීවිතය හා හැම අතින්ම ඇඳී බැඳී පවත්නා කෙසෙල් ශාකය පරිසර සංස්කෘතියට පුදා ඇති දයාදයක් සේ අගය කළ හැකිය.

විශ්‍රාම ලත් විදුහල්පති
ශාස්ත්‍රවේදී
නා.ලි. සාර්ලිස් අමරසිරි

Chemistry-VCE/IB
Individual and group

Priyantha Liyanage
0407664546